# මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

**மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு**

**Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development**

**(කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division)**

**නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.**
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>Mv No. | 7/1/3/2020 යල/චක්‍රලේඛ | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date. | 2020.03 . 04 |

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින්,

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

සභාපති, ලංකා පොහොර සමාගම,
සභාපති, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,

**<u>2020 යල කන්නයේ වී ගොවිතැන සඳහා නොමිලේ පොහොර බෙදාහැරීම</u>**

සහනාධාර පොහොර වැඩසටහන 2020 යල කන්නයේදී ද ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. මෙම වැඩසටහන යටතේ වී ගොවිතැන සඳහා යූරියා, ත්‍රිත්ව සුපිරි පොස්පේට් (ටී.එස්.පී) හා මියුරියේට් ඔෆ් පොටෑෂ් (එම්.ඕ.පී.) පොහොර නිර්දේශයට අනුව නොමිලේ වී ගොවීන් වෙත සැපයීමට කටයුතු කරනු ලැබේ.

2020 යල කන්නයේ දී වී වගාව සඳහා සහනාධාර මත පොහොර බෙදාහැරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හා උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ අඩංගු ***සහනාධාර පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ 5 / 2020*** මෙයට යා කර ඇත. එහි සඳහන් ක්‍රමවේදය, උපදෙස්, සීමාවන් හා කොන්දේසි මැනවින් අවබෝධ කර ගන්නා ලෙසත්, 2020 යල කන්නය ආරම්භ වීමට පෙර අවශ්‍ය දැනුවත්භාවය අදාළ සියලු නිලධාරින්ට ලබා දීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

පොහොර සපයා ගැනීමේදී හා බෙදාහැරීමේදී ප්‍රමාදයන් හා දුෂ්කරතාවයන් වළක්වා ගැනීම සඳහා හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ගබඩාවේදී අවශ්‍ය පොහොර නොමිලේ ලබාදීම තහවුරු කිරීම පිණිස පොහොර බෙදාහැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු පාර්ශවයන් මනා අවබෝධයකින් හා සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාමාර්ග ගැනීම අත්‍යාවශ්‍ය වේ.

තවද, මෙම කන්නයේ සිට රජය විසින් පරිසර හිතකාමී පොහොර නොමිලේ ලබා දීම ආරම්භ කරන අතර ඒ සඳහා තෝරා ගන්නා ගොවිජන සේවා බල ප්‍රදේශවල එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, රසායනික පොහොර භාවිතය අඩුකිරීමට හා පරිසර හිතකාමීපොහොර භාවිතය ඉහල නැංවීම සඳහා ඉහලම ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

රජය විශාල මූල්‍ය දායකත්වයක් සලසමින් ක්‍රියාත්මක කරන පොහොර සහනාධාර වැඩසටහන මඟින් අපේක්ෂා කරන කෘෂිකාර්මික හා ආර්ථික සංවර්ධන අරමුණු සඵල කර ගැනීමට මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීමෙන් ඔබගෙන් ලැබෙන දායකත්වය බෙහෙවින් අගය කරමි.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ
ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

පිටපත් සඳහා කරුණාකර අනෙක් පිට බලන්න


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලේකම්<br>செயலாளர்<br>Secretary | දුරකථන<br>ඊ-මේල්<br>ෆැක්ස් | தொலைபேசி<br>மின்னஞ்சல்<br>தொலைநகல் | Telephone -<br>e- mail -<br>Fax - | 011-2879048<br>secretary@agrimin.gov.lk<br>011-2863497 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | දුරකථන<br>ඊ-මේල්<br>ෆැක්ස් | தொலைபேசி<br>மின்னஞ்சல்<br>தொலைநகல் | Telephone -<br>e- mail -<br>Fax - | 011-2872093, 011-2872097<br>info@agrimin.gov.lk<br>011-2868910 |